සියලු හිමිකම් ඇව්රිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................. සිංහල I කාලය පැය තුනයි

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) සියක් රියන් උස ඇති රන් ඇගෑයක් පබළුදැලෙකින් වසන්නාක්හු මෙන් ද නොහොත් රන් දාගබක් රත්පලසකින් පිළීහස්සේ ලන කලක් මෙන් ද නොහොත් යන පුන්සඳ රත්වලායෙකින් වසන්නාක්හු මෙන් ද නොහොත් රන් පර්වත මුදුනෙකින් පර්වතය වසා ලා රස වගුරුවන්නාක් මෙන් ද නොහොත් සිතුකළුපච්ච බඳුවදමල්දමින් වෙළන කලක් මෙන් ද සකසා වැළඳගෙන රන් ගුහාවකින් නික්මෙන සිංහයක්හු පරිද්දෙන් ගඳකිළියෙන් නික්ම වඩනා නියාව දස දිග කියා යවන මෙහෙවර කරන්නවුන් මෙන් සකල ශරීරයෙන් සවනක් රැස් විහිදුවමින් මහා කාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ පිරිවරා සැවැත්නුවරට වැඩ ගෙපිළිවෙළින් සිඟා වඩනා සේක් බතක් නිසා සිඟා වඩනා ගමනක් නොවතත් අදින්න පුබ්බකයන්ගේ ගෙටත් වැඩි සේක.

(i) රන් ඇගෑයකට සමාන කර දක්වන්නේ කුමක් ද?
(ii) මෙහි සඳහන් සේවකයන් කරන කාර්යය කුමක් ද?
(iii) 'ගඳකිළිය' යන්නට අර්ථ විවරණ සපයන්න.
(iv) 'බතක් නිසා සිඟා වඩනා ගමනක් නොවතත්.' යන්න ලිහිල් බසින් ලියන්න. (ලකුණු 4)

(ආ) මෙසේ මෙසේ නොයෙක් ප්‍රකාරයෙන් එක කුඹුරෙහි වී වියදම් කොට ඉතිරි දෙයක් ගෙනවුත් කොටුවෙක පටවාගෙන බිජුවට යයි එක් භාගයක් තබා ගත මැනව. ඇස් යයි එක් භාගයක් වෙන් කොට බිජුවටභාගය නොකා ඇස්භාගය කැවමැනව. එසේ කන කල පමණ නො දැන නො කා අදට මෙතෙක් ගත මැනව. සෙටට මෙතෙක් ගත මැනවයි පමණ දැන කැව මැනව. මතු මෙතෙක් දවස් ගිය කල ගොයම් පැසෙයි. එවක දක්වා රැකුණ මනා වේ දැයි සිතසිතා සුඟින් සුඟ කැව මැනව. මෙසේ එක් සමයෙක දුක්ගෙන උපයාගත් කල අනික් සමයෙහිත් පෙර නොකළා සේ ම මෙසේ වීර්ය කළමනා ය. මෙසේ දිවිහිමියෙන් ම යලත් මාසත් අප්‍රමාද ව මෙහෙ කළ මැනව. පරික්ෂා කළ කල ගොවීහු නිකම් හිඳිනා දවසෙක් නම් නැත. ලෙඩට හොත් කලත් උපයා කෑ නොහැක්ක. සේවා කම් ආදී වූ නොයෙක් කටයුත්තෙහි නියුක්ත ව ගිය කලත් ගම හිඳ උපයා කෑම නම් නැත් ම ය. මහලු ව ජරාවට පැමිණි කලත් මෙකී කර්මාන්ත කොටගත නොහැකි හෙයින් උපයා කෑ නොහැක්ක. එකල දැතින් දෙදඬු ගෙන විලිපිලියෙන් විරූප ව කුද ගසාගෙන පෙර තමා උපයා කෑ රටට ම වෙස් බැඳ පානා විකාර රූපයක් සේ දොරින් දොර සිඟා කා ඇවිද්ද මනා ම ය.

(i) සුඟින් සුඟ කෑ යුත්තේ ඇයි?
(ii) දිවි හිමියෙන් කළ යුතු කාර්යය කුමක් ද?
(iii) බිජුවට යන්නට අර්ථ විවරණ සපයන්න.
(iv) 'විලිපිලියෙන් විරූප ව' යන්න ලිහිල් බසින් ලියන්න. (ලකුණු 4)

(ඇ) දීපඞ්කර පාදමූල නිදානයෙහි පටන් සමතිස් පෙරුම් පුරා කෙළවර පාරමිතාධර්ම නැමැති ඔටුන්නෙහි අග්‍ර මාණික්‍යයක් බඳු වූ වෙස්සන්තර ජාතකයෙහි පුත්‍රදාරාදීන් පරිත්‍යාගයෙන් සත් වරෙක මහ පොළොව ගුගුරුවා දෙවැනි අත්බැව්හි තුසී පුරයෙහි ඉපද සත් පනස් කෙළ සැට ලක්ෂයක් අවුරුදු දෙවියන්ට ධර්ම දේශනා කොට දස දහසක් ලෝක ධාතුයෙහි දෙව් බඹුන්ගේ අයජමෙන් මහ පස් බැලුම් බලා මව් කුස පිළිසිඳ ගත් බව ද ලුම්බිණි වනෝද්‍යානයෙහි මහා බ්‍රහ්මයා අතට බිහි ව වැඩී විය පැමිණි සියලු ලෝක ධාතුයෙහි අසදෘශාභිෂේක ප්‍රාප්ත ව උයන් කෙළියට යන සඳ දෙවියන් මවා ලූ ජීර්ණ, ව්‍යාධි, මෘත යන තුන් පූර්ව නිමිත්ත දැක මහණ වීමෙහි උත්සාහ ඇති ව මහබිනික්මන් කළ බව ද සාවුරුද්දක් පටන් සැරිසරා වෙසඟ මස මැදි පොහෝ දවස බෝමැඩ විදුරසුන් අරා වැඩ හිඳ බුදු ව ක්‍රමයෙන් සත් සති ගෙවා අට වෙනි සතියෙහි මහබඹු අයජමෙන් බරණැස ඉසිපතන නම් උයන්හි දම්සක් පවත්වා

(i) මෙහි සඳහන් පාරමිතාවක් ඉතා ප්‍රබල බව හැඟවීමට කතුවරයා දක්වන සාධකය කුමක් ද?
(ii) මහණ වීමෙහි උත්සාහ ඇති වූයේ ඇයි?
(iii) 'සමතිස් පෙරුම්' යන්නට අර්ථ විවරණ සපයන්න.
(iv) 'වෙසඟ මස මැදි පොහෝ දවස' යන්න වර්තමාන භාෂාවෙන් ලියන්න. (ලකුණු 4)

(ඈ) ලංකාද්වීපයෙහි අනුරාධපුර නුවර ශ්‍රද්ධාවන්ත වූ එක්තරා ස්ත්‍රියක් නිරන්තරයෙන් මල් කඩා ගෙනවුත් අභයගිරි දා ගැබට මල් පූජා කරන්නී ය. ඉක්බිති එක් දවසෙක ඒ ස්ත්‍රී තොම තමාගේ බාල දුවක් කැඳවාගෙන දා ගැබට මල් පුදනු පිණිස ගොසින් මලසුන් ගෙයි පැන් නොදැක මල් පැස දුව අතට දී පැන් ගෙනෙනු සඳහා කළය ගෙන පොකුණට ගියා ය. එකල්හි ඒ ස්ත්‍රියගේ දු තොම මලස්න නො සෝධා අත ශුද්ධ නො කොට තමාගේ මව නො එන තෙක් ම මල් මිටක් ඇරගෙන මණ්ඩලාකාරයෙන් වට කොට පුදා මෙසේ ප්‍රාර්ථනා කළා ය.

(i) මේ ස්ත්‍රිය මල් පූජා කළේ කුමකට ද?
(ii) මල් පැස දුව අතට දුන්නේ ඇයි?
(iii) 'තමාගේ මව නො එන තෙක් ම' මේ කොටස ලිහිල් බසින් ලියන්න.
(iv) 'මලසුන් ගෙයි' යන්නට අර්ථ විවරණ සපයන්න. (ලකුණු 4)

(ඉ)
නිල් මිණි රැස් පැතිර
නිල් වත සිතබ පුරඹර
ගජ මද හෙත විසිර
එපුර වහරෙව් දිසි හැම වර

හය කුර රොන් ගසින්
ගිජිඳු ගිජිඳුන් වෙසෙසින්
හළ පොකුරඹ රසින්
තුරඟ සැනසෙති එපුර වෙසෙසින්

(i) නිල් මිණි රැස් පැතිරීමෙන් සිදු වූයේ කුමක් ද?
(ii) තුරඟ සැනසෙන්නේ කුමකින් ද?
(iii) ''වහරෙව්' යන්නෙහි කාව්‍යාලංකාරය කුමක් ද?
(iv) 'පොකුරඹ' යන්නට අර්ථ විවරණ සපයන්න. (ලකුණු 4)

(ඊ) පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''හින්නේර මල් බඳු ඇස් ඇති මනා වූ හාවභාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නො කරව''
(ii) ''ලදොත් ජීවත් වන්නාක් මුත් නො ලදොත් ජීවිතය හරිමි''
(iii) ''තොප කීයේ කාරණා ම ය. ඥානවන්තයන් සිතුවමනා සිතුවිල්ලෙක්ම ය''
(iv) ''ඒ තොම තමා හා සමාන ජාති ඇති පුරුෂයන් විසින් එවන ලද පඬුරු නොගන්නී ය''
(v) ''ගොස් දැන් සැතපෙන්නෙමි මම යහනේ පමා නොවී යළි එන්නෙමි ඔබ වෙත''
(vi) ''එන්න අද විතරක්වත් ගේ ඇතුළේ නිදා ගන්න. තින්ද නො ගියත් කමක් නෑ''
(vii) ''අයියෝ! එතකොට අපට වෙන්නේ බඩගින්නෙ මැරෙන්ඩ. හොඳයි මට එක සේරුවක්වත් දෙන්ඩ.''

(ලකුණු 3 x 4 = 12)

(උ) පහත දැක්වෙන පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මිනිහා නගන කට හඬ නොම වැටෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගසක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහී
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහී
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙහී
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහී

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතුව

දවසට සිය විටක් මවුපිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැතිව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවුපිය කුරුල්ලන් ආහාර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින රිසින්
දුටුවා හිස්ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළිවෙනකොට හතර වටින් (ලකුණු 12)

02. මට්ටකුණ්ඩලී කතාව තුළින් හෙළිවන ධර්මසේන හිමියන්ගේ මානව දයාව උදාහරණ සහිතව අගය කරන්න.

**නැතහොත්**

මිනිස් ගුණ මෙන් ම අගුණ ද කලාත්මකව පෙන්වා දෙන නිර්මාණයක් ලෙස චන්ද කින්නර ජාතකය හැඳින්විය හැකි ය. චරිත නිරූපණය ඇසුරින් විමසීමක් කරන්න. (ලකුණු 15)

03. පුද්ගලයා ලෞකික සැපතින් දුරස් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා යොදා ගත් සාහිත්‍යමය උපක්‍රම පිළිබඳ ස්වර්ණතිලකා වස්තුව ඇසුරින් විමසන්න.

**නැතහොත්**

අනුරුද්ධ කුමාර චරිතය ඇසුරින් මානව ජීවිතය පිළිබඳ කතුවරයාගේ දෘෂ්ටිය හෙළි කරන අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. (අ) කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වීමට හේතු දක්වන්න. (ලකුණු 7)

(ආ) උදේනි පුර සැණකෙළිය ශෘංගාර රසයෙන් අනූන වර්ණනයක් ලෙස අගය කරන්න. (ලකුණු 8)

05. බැද්දේගම නව කතාවෙන් පිළිබිඹු වන්නේ මහා සමාජයෙන් ඈත් වූ පිටිසර බද හුදෙකලා පීඩාකාරී ජන ජීවන තොරතුරු ය. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. නූතන කෙටිකතාකරුවන් ග්‍රාමීය පරිසරයෙන් ලබාගත් අත්දැකීම් ඇසුරින් අපූරු නිර්මාණ බිහි කරන අයුරු උදාහරණ සහිතව නියමිත කෙටිකතා දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු 15)

07. ''නූතන කවියේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ පරිසරය කෙරෙහි මිනිසා දක්වන සංවේදීතාවයි'' නිදසුන් තුනක් අරසුරින් මෙම කියමන පිරික්සන්න. (ලකුණු 15)

08. 'පේමතෝ ජායතී සෝකෝ' නාට්‍යය නිර්මාණයේ දී සරච්චන්ද්‍රයන් මුල් කතා වස්තුව වෙනස් කළ අයුරු නාට්‍ය පෙළ ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 15)

* * *

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

71 S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ සිංහල II කාලය පැය තුනයි

- **I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.**

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 තාලුජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය වන්නේ,

1. ප, ඵ, බ, භ, ම
2. ත ථ ද ධ න
3. ක ඛ ග ඝ ඞ
4. ච ඡ ජ ඣ ඤ
5. ට ඨ ඩ ඪ ණ (.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. මර්දනය, ආභාෂය, ප්‍රධානය, ගවේශනය, දර්ෂණය
2. මර්ධනය, ආභාෂය, ප්‍රදානය, ගවේෂණය, දර්ශනය
3. මර්දනය, ආභාසය, ප්‍රදානය, ගවේෂණය, දර්ශනය
4. මර්දනය, ආභාසය, ප්‍රධානය, ගවේෂණය, දර්ශනය
5. මර්ධනය, ආභාසය, ප්‍රදානය, ගවේෂණය, දර්ෂණය (.....)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. සීතාවක, කෝට්ටේ, පොළොන්නරුව, දඹදෙණිය, රයිගම.
2. අනුරාධපුර, පොළොන්නරුව, යාපහුව, කුරුණෑගල, ගම්පොළ.
3. අනුරාධපුර, රයිගම, යාපනය, කෝට්ටේ, යාපහුව
4. කුරුණෑගල, කෝට්ටේ, ගම්පොළ, යාපනය, යාපහුව
5. පොළොන්නරුව, රයිගම, ගම්පොළ, යාපහුව, දඹදෙණිය. (.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. හල් අකුරකට ද රේඵය යෙදිය හැකි ය.
2. රකාරාංශය වෙනුවට ද රේඵය යෙදිය හැකි ය.
3. 'ර්' කාරයට මුලින් ඇති ව්‍යඤ්ජනයට ද එම 'ර්' කාරය වෙනුවට රේඵය යෙදිය හැකි ය.
4. රේඵය ඉස්පිලි සංකේතයට සමාන ය.
5. 'ර්' කාරයට පසු ව ඇති ව්‍යඤ්ජනය වෙත ද එම 'ර්' කාරය වෙනුවට රේඵය යෙදෙයි.(.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. පුෂ්ප සුගන්ධ, මනුෂ්‍ය වර්ගයා, වෛද්‍ය විදුහල, පාසල් සිසු
2. තෙවළා දහම, ඇතුගල් පුර, නීල මාණික්‍යය, කිතු ගොස
3. බුදු සාසනය, සීල ව්‍යාපාරය, මැති සභාව, මංගල රිය.
4. අටවංක මාණික්‍යය, අග විනිසුරු, ඇමති මඩුල්ල, ස්වභාව දහම
5. සඳ මණ්ඩලය, කර්ම විබත, සභා ගැබ, කතු වැකිය. (.....)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. චක්‍රෝක්ති, නාට්‍ය, ධෛර්ය, දෙටු
2. ඝෘතු, ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ
3. ආයුර්වේද, කම්කිරිය, සාරගර්භ, හෘදය
4. පමණ, චංචල, භූමිකම්පා, ප්‍රසිද්ධ
5. කත, වෛද්‍ය, භාර්යා, පුෂ්කරණිය. (.....)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. දිගු, මළුව, ප්‍රදක්ෂිණා, බිම.
2. මන්දිර, ශීර්ෂ, පීඨය, ගර්භය
3. අග්‍ර, වික්‍රම, වර්ග, ව්‍යාඝ්‍ර
4. වෙසක්, මිහි, අකුරු, මහඟු
5. මිථ්‍යා, සාහිත්‍ය, හස්ති, ශබ්ද (.....)

1.8 සම්බන්ධ, අවධි, සම්ප්‍රදාන, ආධාර යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

1. අහස්දිය, බුදුගුණ, පින්හාල්, සඳරැස්
2. බුදුගුණ, අහස්දිය, පින්හාල්, සඳරැස්
3. සඳරැස්, බුදුගුණ, අහස්දිය, පින්හාල්
4. පින්හාල්, සඳරැස්, බුදුගුණ, අහස්දිය
5. බුදුගුණ, අහස්දිය, සඳරැස්, පින්හාල් (.....)

1.9 කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

1. නටන, ගයන, බලන, කරන
2. නැටිලි, බැලිලි, කෙටිලි, පැනිලි
3. කියමන්, රැගුමන්, බැලුමන්, රැවුමන්
4. රැවුම්, ගෙරවුම්, පවුම්. බැලුම්
5. නැටීම්, වැටීම්, කෙටීම්, බැලීම් (.....)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

**(බසිමින්, ගයා, කරවයි, කළහොත්)**

1. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා.
5. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා (.....)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. නෛතික, දෛනික, ඓතිහාසික, ධාර්මික
2. ඉසුරුමත්, බුද්ධිමත්, සිරිමත්, දිරිමත්
3. සිල්වත්, ගුණවත්, ධනවත්, ආදර්ශවත්
4. ගැමියා, තොටියා, සැබියා, නැවියා
5. ජනතා, ලෝතා, දුර්වලතා, උගතා (.....)

1.12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1. අතික්‍රම, අධිකරණය, අනුනායක, අතිරස
2. සුදන, දුබල, කුසල, අමිල
3. පිරිසිදු, පරාජය. ප්‍රතිලාභ, සංවත්සර
4. අවතීර්ණ, ආගමනය, නිවාරණ, අනුරූ
5. කුකවි, පබල, නිදුක්, සපල (.....)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. ගෙන්. සහ, අපොයි, අයුරු
2. යළි, තාක්, පවා, මිස
3. හනික, වනාහි, සවන්, හෙවත්
4. ඉඳුරා, නිසා, ගැන, අනුව
5. නමුදු, හොත්, පිණිස, වෙත (.....)

1.14 ''බැතිමත්හු බුදුන්ගේ **තෙමඟුල** සිහිගන්වමින් **උත්කර්ෂවත්** ලෙස **පූජෝපහාර** දක්වති.''යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

1. සමාස, තද්ධිත, සන්ධි
2. සන්ධි, සමාස, තද්ධිත
3. සමාස, සන්ධි, තද්ධිත
4. සන්ධි, තද්ධිත, සමාස
5. තද්ධිත, සන්ධි, සමාස (.....)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. කිරීමට, ගැනීමට, කෑමට, ගොස්
2. දැක, නටා, පවසා, කා
3. ගයමින්, බසිමින්, ලිවීමට, යමින්
4. එනු, ගනු, යනු, නටද්දී
5. පැවසුවොත්, ලැබුණොත්, බල බලා, කැවොත් (.....)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. පොල්මල, අක්කානගෝ, කුරුළුකූඩුව, පින්පඩි
2. සොරබිය, ගම්වැසි, ගුරුපඬුරු, මුහුදුදිය
3. මිණිමුතු, බමුණුදන්, ගුරුතුමා, අතැවැසි
4. ගත්කරු, බඹදත්, කිරිබත්, පරපුටු
5. අකුසල්, කුපුරිස්, කුමරා, සුමිතුරු (.....)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. පිළිතුරු, මුනිතුමා, බුදුකුරු, මුදලිඳු
2. ගුණැති, යටැසින්, දිනිසුරු, පසැස්
3. කොස්සතු, නෙතින්, දැත, විස්සම්
4. සිත්තම්. දඬුවම්, ළිග්ගල, තුනුවග
5. නිරොද, තඹපල්ලෙන්, දුප්පත්, ගෙත්තම් (.....)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් සහිත වරණය තෝරන්න.

1. ගුණවත්, සෙනෙහෙවත්, පින්වත්, සිල්වත්
2. වලස්සු, පන්නම්, විස්සම්, මෝසම්
3. ලියද්දී, දුවද්දී, ලබද්දී, කියද්දී
4. ආධ්‍යාත්මික, වෛශේෂික, භෞතික, ව්‍යාවහාරික
5. තලතෙල්, වනමල්, පොල්තෙල්, සඳරැස් (.....)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

1. සිසුන් පන්තියට පැමිණ නැත.
2. විචාරකයන් පාඨක ප්‍රතිචාර අගය කරති.
3. උගතුන් රට හැර යති.
4. වෙළඳපොළෙහි පාරිභෝගිකයන් නැත.
5. එදිරිවීර සරච්චන්ද්‍රයෝ නාට්‍ය කෘති රැසක් රචනා කළේය. (.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. අපි කැමට ලෑස්ති වෙමු.
2. ගුරුවරු බොහොම හොඳට වැඩ කරනවා.
3. ඉංජිනේරුවෝ අතිනවීන තාක්ෂණය යොදා ගනිමින් මහා මාර්ග ඉදි කරති.
4. සිසුන් පාඩම් කරනව නම් විභාගය පාස් වෙයි.
5. එයා මල් හිටවනව ලු. (.....)

## II කොටස

* **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

02. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අප උගන්නා ඕනෑ ම විෂයයක් මගින් බ්ලූම්ගේ අධ්‍යාපනික අරමුණු වර්ගීකරණයෙහි සඳහන් ප්‍රජානන, ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍ර යම් තරමකින් පෝෂණය විය හැකි වුව ද විෂයයේ ස්වභාවය අනුව ඒ ඒ ක්ෂේත්‍රයට පැවරෙන බර විවිධාකාර වේ. ගණිතය මගින් අපේක්ෂා කෙරෙන්නේ බොහෝ විට ගැටලු නිරාකරණය සඳහා ගණිත සංකල්ප හැසිරවීමකි. එහෙයින් සංකල්ප අවබෝධය තුළින් ලබන ආවේදනයන් සහ එමගින් තම ජීවන ශෛලීන් හැඩගන්වා ගැනීම් ප්‍රමුඛ වේ. එම නිසා එම විෂයයන්හි වැඩි නැඹුරුවක් තිබෙන්නේ ප්‍රජානන හා ආවේදන ක්ෂේත්‍රවලට ය. එලෙසින් ම තාක්ෂණික විෂයයන්ගේ වැඩි නැඹුරුවක් හසුරු කුසලතා වර්ධනය කෙරෙහි යොමු ව තිබේ. මේ නිසා ඒවායෙහි වැඩි බර මනෝචාලක ක්ෂේත්‍රයට ය. සංකල්පමය බව අනෙකුත් විෂයයනට සාපේක්ෂ ව ඒවායෙහි ප්‍රමුඛ වී නැත. මේ අනුව ගණිතය යනු, ප්‍රජානන හා ආවේදන ක්ෂේත්‍රයනට වැඩි නැඹුරුවක් ඇති වියුක්ත සංකල්පමය විෂයයක් ලෙස හැඳින්වීම සුදුසු වේ.

1. මේ ලේඛකයා පවසන පරිදි අධ්‍යාපන අරමුණු කීය ද? ඒ මොනවා ද?
2. සෑම විෂයකින් ම අධ්‍යාපන අරමුණු සමානව ඉටුවන බව මෙයින් ප්‍රකාශ වේ ද?
3. මනෝචාලක යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
4. බුද්ධාගම හා සාහිත්‍යය තුළින් කවර අධ්‍යාපන අරමුණු සාධනය වේ ද?
5. ගණිතය විෂයෙහි සහ තාක්ෂණික විෂයන්හි වෙනස කුමක් ද?
6. මේ වචනවල අර්ථ ලියා දක්වන්න.

   i). වින්දනය ii) සාපේක්ෂ (ලකුණු 2x6=12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **<u>තුනෙන් එකක් පමණ වන සේ</u>** සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

වසර දහස් ගණනක් මුළුල්ලේ සිට ම මිනිසා කෘෂි බෝග වර්ග තෝරා ගනිමින් වගා කිරීමේ කටයුතුවල නිරත විය. මොවුහු ඖෂධ වර්ග බෝග ආරක්ෂක නිපැයුම් සහ සුවඳ විලවුන් වර්ග ආදී දහසකුත් එකක් අවශ්‍ය නිෂ්පාදනයන් සඳහා කෘෂි බෝග පදනම් කර ගත්හ. කෘෂි බෝග ලෙස අප විසින් යොදා ගනු ලබන පැළෑටි බොහොමයක් ඒවායේ පෙර තිබූ කැළෑ තත්ත්වයන් වැඩි දියුණු කර මූලික වශයෙන් ඒවා මිනිස් අවශ්‍යතාවන්ට සහ ඕනෑ එපාකම්වලට සරිලන පරිද්දෙන් වෙනස් කරනු ලැබූ ඒවා ය. මෙම බෝග වර්ගවල විකාශය සහ ජෛව විවිධත්වය වසර දහස් ගණනක පරිණාමයේ ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාව වනාහි බෝග රෝපණ උපාංග සහ කෘෂි ජෛව විවිධත්වයන් සඳහා වටිනා ආරක්ෂිත ගබඩා ස්ථානයක් ලෙස සැලකිය හැකි ය. මන්ද අප රටෙහි සතු දේශගුණය, පස, වර්ෂාපතනය වැනි දේවල් පළාතින් පළාතට වෙනස් වන බැවින් විවිධ බෝග වර්ග වගා කිරීම සඳහා ඒ ඒ පළාත් සුදුසුතාවන් දක්වන බැවිනි. අප රට සතු ව ඉතා වටිනා වී විශේෂ පවතින අතර වී විශේෂ දෙදහස් අටසියයකට අධික සංඛ්‍යාවක් වාර්තා ගත ව පවතී. මෙම වී ප්‍රභේදයන් පුළුල් පරාසයක දේශගුණික තත්ත්වයන් පටතේ යොදාගැනීමේ හැකියාව ඇති අතර පළිබෝධ සහ රෝග ආදියට ඔරොත්තු දීමේ හැකියාවක් ද දක්වයි. මෙම වී ප්‍රභේදයන්හි ඇටවල ප්‍රමාණයන් සහ ගුණාත්මක භාවයේ දී පැහැදිලි වෙනස්කම් දක්නට ඇති අතර සමහර බෝග වර්ග ඖෂධීය ගුණයෙන් සහ සුවඳින් ද යුක්ත වේ. විවිධ පළාත්වල පවතින දේශගුණික විපර්යාසයන් නිසා ඒ ඒ පළාතට ආවේණික වූ ශාක හා සත්ත්වමය විශේෂ පවතී. (ලකුණු 13 යි)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සිංහල හඬ කැවූ විදෙස් ටෙලි නාට්‍ය දේශීය සංස්කෘතියට සිදුකරන බලපෑම.

(ii) ගෝලීය උණුසුම ඉහළ යාම නිසා ඇතිවිය හැකි ගැටලු.

(iii) දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමට ගත හැකි පියවර

(iv) කායික හා මානසික යෝග්‍යතාව සඳහා ක්‍රීඩාවේ අවශ්‍යතාව.

(v) ස්වාභාවික සම්පත් සුරක්ෂිත කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග. (ලකුණු 25යි)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) සිසුහු ඉගෙනුමට මැළි වෙත් නම් ගුරුවරු ඒ ගැන සැලකිලිමත් විය යුතු ය.

(ii) ඒ මොහොතේ කිසිවෙක් එහි සිටියේ නැත.

(iii) දරුවෝ පැමිණෙති'යි මව්පියෝ බලා සිටිති.

(iv) රිය අනතුරින් පසු සිව් දෙනෙක් රෝහල් ගත කරනු ලැබූහ.

(v) නිළියක් වූ ඇය දක්ෂ ගායිකාවක් ද වූවා ය.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරයකට හරවන්න.

(i) හෙතෙම කෘෂි කර්මාන්තය ගොඩ නැංවීය.

(ii) බුද්ධපුත්‍ර හිමියෝ පූජාවලිය රචනා කළහ.

(iii) විදුහල්පතිතුමා පැමිණ සිට අමුත්තන් සාදරයෙන් පිළිගනියි.

(iv) දක්ෂ වෛද්‍යවරියක් පිළිකා රෝගීන් සුවපත් කළා ය.

(v) චණ්ඩමාරුතය නිවාස හා දේපළ සුන් බුන් කරයි.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ඇතැම් (පුද්ගලයෝ / පුද්ගලයන්) දූෂමාන ආරංචි (පතුරවයි / පතුරවති)

(ii) (ගුරුවරයෙක් / ගුරුවරයෙකු) ලෙස සේවය කරන එතුමා දක්ෂ (නාට්‍ය රචකයෙක්/රචකයකු) වෙයි.

(iii) (දෙවියෝ / දෙවියන්) වනාහි උත්තම මනුෂ්‍ය හදවත්වල (නිර්මාණකරුවෝ / නිර්මාණකරුවන්) වෙති.

(iv) (අදුරුතුමන් / ඇදුරුතුමෝ) සිය දේශනයෙන් (රසභාවයෝ/රසභාවයන්) අවදි කළහ.

(v) (ඕතොමෝ / ඇය) විසින් කිරිපිඬු දානයක් පිරිනමන (ලදි/ලද්දීය).

(ලකුණු 5x3=15)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනුඅංගය දක්වන්න.

1. **සිල්වත්** භික්ෂූන්ට **නිති** ගරු **කිරීම** බෞද්ධයාගේ සිරිතකි.
(සිල්වත් - තද්ධිත, නිති - නිපාත, කිරීම - කෘදන්ත)

2. **සුරඟනන්** සබය දෙස **යටැසින් බලා** නටන අයුරු එහි විස්තර වේ.
(සුරඟනන් - සමාස, යටැසින් - සන්ධි, බලා - ක්‍රියා)

3. **වේගයෙන්** පැමිණි බස් රිය **මාර්ගයෙන්** ඉවතට පැන සිදු වූ **රිය අනතුර** නිසා බොහෝ දෙනා කම්පා වෙති.
(වේගයෙන් - විශේෂණ, මාර්ගයෙන් - විභක්ති, රිය අනතුර - සමාස)

4. **තම්පලා** රසවත් මෙන් **ම** ගුණවත් ආහාරයක් බව **ආයුර්වේදයේ** සඳහන් වේ.
(තම්පලා - සන්ධි, ම - නිපාත, ආයුර්වේදයේ -විභක්ති)

5. **ඇගේ දිගටි** මුහුණ සඳමඬල **මෙන්** දීප්තිමත් බව මට සිතුණ.
(ඇගේ - විභක්ති, දිගටි - තද්ධිත, මෙන් - නිපාත) (ලකුණු 3x 5 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(ප්‍රවේණි, තාත්වික, ස්වදේශීය, ආවේණික, ලෞකික, විදේශීය)

(අ) 1. ..................................... ශාක හා සත්ත්ව විශේෂ පිළිබඳ හෙළ වෙදකමේ ඉගැන් වේ.

2. නාට්‍ය කලාවේ දී ........................................... රංග සම්ප්‍රදාය යුරෝපීය රටවල බහුල ව භාවිත විය.

3. වැඩවසම් සමාජය තුළ ........................................ දාසයෝ සිය අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් සටන් කළහ.

4. ....................................... සංචාරකයින්ගේ පැමිණීම අඩු වී ඇතැයි සංචාරක කර්මාන්ත හිමියෝ පවසති.

5. බුදු දහම ............................... සැපතට වඩා ආධ්‍යාත්මය කෙරෙහි අවධානය යොමු කරයි.

(ලකුණු 1/2 x 6 = 3)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | පූජා + උත්සව | (ii) | උන් + උන් | (iii) | පිතෘ + අර්ථ |
| (iv) | දෙ + උර | (v) | අණු + ඊක්ෂ | (vi) | අඹ + මල් |

(ලකුණු 1/2 x 6 = 3)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ආදී සිසුන් විසින්** නවක **ශිෂ්‍යයෝ** පිළිගන්නා ලදහ.

(ii) **දෙවියනි**, ඔබ **මට** පිළිසරණයි.

(iii) ඇදුරුතුමා **දුම්රියෙන්** බැස **යතුරුපැදියෙන්** නිවසට ගියේය. (ලකුණු 1/2 x 6=3)

(ඇ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය සියල්ලෝ තේරුම් ගනිත්වා

(ii) සිංහල හෝඩියේ හ්‍රස්ව කෙටි ස්වර කොපමණ ද

(iii) ඕ යහපත පැහැපත රූපත. (ලකුණු 1/2 x 6 = 3)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) ''මට පැන් ටිකක් දෙන්න.'' යාචකයා කී ය.

(ii) '' මම ද එම් එම දින'' ශක්‍රයා පැවසීය.

(iii) ''අපි විභාගය උසස් ලෙස සමත් වෙමු.'' යි ශිෂ්‍යයෝ පැවසූහ.

(ලකුණු 1 x 3 = 3)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිසා සෑම විට ම අන්‍යාගම්වලට ගරු කළ යුතු ය. ලොව පුරා ජනවාර්ගික හා **ආගමික** ගැටුම් ඇති වීමට මූලික හේතුව වී ඇත්තේ මේ අන්‍යෝන්‍ය **ගෞරවය,** එකිනෙකා අතර **අවබෝධය** හා **විශ්වාසය** නොමැතිකම ය. තම ඇදහිලි හා විශ්වාස පමණක් නිවැරදිය යි සිතන්නා ආත්මාර්ථකාමී පුද්ගලයෙකි. ඔහුට අනෙකාගේ සිත දිනාගනිමින් **සහජීවනය** හා **සංහිඳියාව** වෙත යා නොහැකි වේ. ලොව සියලු ආගම් හා දර්ශනවාද වෙන් ව ඇත්තේ මනුෂ්‍යයාගේ යහපැවැත්ම උදෙසා බැවින් අප කළ යුතු වන්නේ කුමක් හරිදැයි සෙවීම වෙනුවට ඒ සියල්ල තුළ ඇති මානව සමාජයේ වියවුල් බවට තුඩු දෙන කරුණු ඉවත ලා උත්තරීතර බවට හේතුවන කරුණු පමණක් රැගෙන උතුම් මනුෂ්‍යයෙකු වීමට වැර වෑයම් කිරීම ය.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කරන්න.

(ii) අන්‍යෝන්‍ය, නිවැරදි, ගෞරවය යන වචනවල පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. තාලුජ අක්ෂරයක් යෙදුණු වචනයක් හා මහප්‍රාණ අක්ෂරයක් යෙදුණු වචනයක්.
2. අනුස්වාරය සමග සඤ්ඤක අකුරක් යෙදුණු වචනයක්.
3. ස්වරයක් හා දන්තජ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචන දෙකක්.

(iv) පහත සඳහන් පද සන්ධි කර සන්ධි විදිය දක්වන්න.

1. වියවුල් 2. එකිනෙක 3. ආත්මාර්ථ

(v) පහත සඳහන් ක්‍රියා වර්ගවලට සම්බන්ධ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

1. අපර ක්‍රියා 2. මිශ්‍ර ක්‍රියා 3. පූර්ව ක්‍රියා (ලකුණු 3 x 5 = 15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අන්තඃස්ථ අක්ෂර (අර්ධ ස්වර)

(ii) ගාත්‍රාදේශ සන්ධිය

(iii) උපසර්ග භාවිතය

(iv) පුරුෂාර්ථ සර්වනාම

(v) ත්‍රෛකාලික ක්‍රියාව (ලකුණු 5 x 3 = 15)

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය 2019 - සිංහල I**

**පිළිතුරු පත්‍රය - I**

01. (අ) (i) බුදු සිරුර
(ii) ගඳකිළියෙන් නික්ම වඩිනා බව දස දිසාවට ම දැනුම් දීම.
(iii) බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කුටිය.
(iv) ''ආහාර සඳහා බත් අපේක්ෂාවෙන් වඩින ගමනක් නොවන නමුත්''

(ආ) (i) අනාගතයේ අස්වනු ලැබෙන දවස් දක්වා ධාන්‍ය පරිස්සම් කරගත යුතු නිසා.
(ii) යල් කන්නයේ හා මාස් කන්නයේ ගොවිතැන් කිරීම.
(iii) පැළ ලබා ගැනීම සඳහා ඉතිරි කරගන්නා ධාන්‍ය.
(iv) සමෙහි රැළි හා ඉදුණු කෙස්වලින් අවලස්සණ වී.

(ඇ) (i) මහ පොළව කම්පා වීම.
(ii) දෙවියන් විසින් මවන ලද මහලු, ලෙඩ, මරණ යන පෙරනිමිති තුන දැකීම නිසා.
(iii) පාරමිතා දහයකි. එය දස උප පාරමිතා දස පරමත්ථ පාරමිතා වශයෙන් විස්සක් සමග තිහක් වේ.
(iv) වෙසක් මාසයේ පුර පසළොස්වක පෝය දවසෙහි.

(ඈ) (i) අභයගිරි විහාරයේ ධාතු ගර්භයට.
(ii) මලසුන් ගෙයි පැන් නොතිබූ බැවින් පැන් ගෙන ඒමට යාම සඳහා.
(iii) තම මව පැමිණෙන තුරු නොසිට / පැමිණීමට පෙර
(iv) පැරණි දාගැබ්වලට මල් පිදීම සඳහා සකස් කර තිබූ ආවරණ සහිත මල් ආසනය. මල් අසුන්ගෙය.

(ඉ) (i) නගරයේ අහසේ සුදු වලාකුළු නිල්පාට වීම.
(ii) ඇතුන් සොඬවැලෙන් විහිදුවන වතුරෙන්.
(iii) උපමා වහර + එව් - වැසි දවසක් වගේ.
(iv) පොකුරු + අඹ යන්නෙන් සකස් වී ඇත. පොකුරු යනු සොඬවැලෙහි අගයි. අඹ යනු වතුරයි. සොඬවැල අගින් විහිදුවන වතුර පොකුරඹ යනුවෙන් හැඳින්වේ. (4x4=16)

(ඊ) (i) පන්සිය පනස් ජාතික පොතේ චන්ද කින්නර ජාතකයේ ඇතුළත් වන්නකි. කිඳුරාට ඊතල පහර වැදීමෙන් දුකට පත් කිඳුරිය වැලපෙද්දී ඇය අසලට එන බඹදත් රජ ඇය අමතා මෙසේ පවසයි.
(ii) ධර්ම සේන හිමියන්ගේ සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවේ ඇතුළත් වේ. මට්ටකුණ්ඩලී වේශයෙන් සොහොනට පැමිණි දිව්‍ය පුත්‍රයා අදින්න පුබ්බක බමුණා අමතා පවසයි. තමාට ඉර හඳ අවශ්‍ය බව ඔහුට පැවසූ අවස්ථාවේ.
(iii) බුද්ධ පුත්‍ර හිමියන්ගේ පූජාවලියේ අනුරුද්ධ කුමාර වස්තුවෙහි ඇතුළත් වේ. අනුරුද්ධ ඇතුළු කුමාරවරු මහණවීමට ගොස් පළමුව උපාලි කපුවා මහණ කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඔවුන් අමතා මෙසේ වදාළ සේක.
(iv) දෙවන ධර්ම කීර්ති හිමියන්ගේ සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවෙහි ඇතුළත් වේ. ස්වර්ණතිලකාට පඬුරු යැවූ සැඩොල් තරුණයා ඇය ඒවා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ රජුට ප්‍රකාශ කළ අවස්ථාවේ රජ අමතා ඔහු මෙසේ පවසයි.
(v) සරච්චන්ද්‍රයන්ගේ පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙන් උපුටා ගත් පාඨයකි. ස්වර්ණතිලකා දැකීමෙන් වික්ෂිප්ත වූ උද්දාළ බමුණා සිප්හලට ගොස් සිසුන් අමතා මෙසේ පවසයි.

(vi) මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ වහල්ලු කෙටිකතාවේ ඇතුළත් වන්නකි. රාත්‍රී කාලයේ වර්ෂාව ඇදහැලීම නිසා උපාලිස්ගේ බිරිඳ පැමිණ ඉස්තෝප්පුවේ නිදා සිටි උපාලිස් අමතා මෙසේ පැවසුවා ය.

(vii) ලෙනාඩ් වුල්ෆ් මහතාගේ බැද්දේගම නව කතාවෙන් උපුටා ගත්තකි. සිළිඳු බබෙහාමි ආරච්චි වෙත ගොස් ණයට කුරහන් ටිකක් ඉල්ලා සිටි අවස්ථාවේ ආරච්චිල එයට අකමැති වෙයි. එම අවස්ථාවේ සිළිඳු ඔහු අමතා මෙසේ පවසයි. (4x3=12)

(උ) සත්වයා ස්වාධීන වීමට ඇති ආශාව ඒ වෙනුවෙන් ගන්නා උත්සාහය එහි දී මතුවන අභියෝග ආදිය කුරුලු පැටවෙකු සංකේතාත්මකව යොදා ගනිමින් කලාත්මකව විවරණය කිරීම අනුභූතියයි. ඒ සඳහා කවියා භාෂාව හසුරුවා ඇති අයුරු හා සංකල්පරූප මැවෙන අයුරු විස්තර කරමින් කරන සාර්ථක පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 12)

2 සිට 8 දක්වා ප්‍රශ්නවලට උචිත උපුටා ගැනීම් සහිතව ලියා ඇති සාර්ථක පිළිතුරකට ඉහළ ලකුණක් ලබා දෙන්න. උදාහරණ තුනක්වත් තිබිය යුතු ය.

## පිළිතුරු පත්‍රය II
## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | 4 | 11. | 5 |
| 02. | 3 | 12. | 2 |
| 03. | 4 | 13. | 3 |
| 04. | 5 | 14. | 1 |
| 05. | 2 | 15. | 2 |
| 06. | 2 | 16. | 5 |
| 07. | 4 | 17. | 1 |
| 08. | 2 | 18. | 2 |
| 09. | 4 | 19. | 1 |
| 10. | 4 | 20. | 3 |

## II කොටස

02. (අ) (i) 3 යි. ප්‍රජානන, ආවේදන, මනෝචාලක.

(ii) නැත.

(iii) කායිකව පෙන්වන දක්ෂතා.

(iv) ප්‍රජානන, ආවේදන

(v) ගණිතය විෂය ප්‍රජානන හා ආවේදන ක්ෂේත්‍රවලටත් තාක්ෂණික විෂයයන් මනෝචාලක ක්ෂේත්‍රයටත් නැඹුරු වීම.

(vi) 1. වින්දනය - යම් දෙයක් වටහා ගැනීමෙන් ලබන මානසික සතුට.
2. සාපේක්ෂ - එක් සංකල්පයක් හෝ වස්තුවක් තවත් දෙයක් හා සසඳා බැලීම.

(ආ) වචන 65 - 75 අතර තිබිය යුතුයි.
* අතීතයේ පටන් විවිධ නිෂ්පාදනයන් සඳහා කෘෂි බෝග වගා කිරීම.
* කැළෑ තත්ත්වයන් වෙනස්කර සකස්කරගත් ඒවා බව.
* පරිණාමය වසර දහස් ගණනකි.
* ලංකාව කෘෂි බෝග සඳහා උචිත බව.
* විවිධ බෝග වර්ග අප රටෙහි පැවතීම.
* පළිබෝධවලට ඔරොත්තු දීම හා ඖෂධීය ගුණයෙන් යුක්ත වීම.
* දේශගුණික විපර්යාස මත ශාබ හා සත්ව විශේෂ පැවතීම.

04. (අ) (i) සිසුහු ඉගෙනීමට මැලි වෙත් නම් ගුරුවරුන් ඒ ගැන සැලකිළිමත් විය යුතුය.
(ii) ඒ මොහොතේ කිසිවෙකු එහි සිටියේ නැත.
(iii) දරුවන් පැමිණෙති'යි මව්පියෝ බලා සිටිති.
(iv) නිවැරදි වැකියක්.
(v) නිළියක වූ ඇය දක්ෂ ගායිකාවක් ද වූවා ය.

(ආ) (i) ඔහු විසින් කෘෂිකර්මාන්තය ගොඩ නංවාවන ලදී/ගොඩ නංවනු ලැබීය/ගොඩ නැගිණි.
(ii) බුද්ධ පුත්‍ර හිමියන් විසින් පූජාවලිය රචනා කරන ලදී/රචනා කරනු ලැබීය/රචනා කෙරිණි.
(iii) විදුහල්පතිතුමා විසින් පැමිණ සිටි අමුත්තෝ සාදරයෙන් පිළිගනු ලබති./පිළිගැනෙති.
(iv) දක්ෂ වෛද්‍යවරියක විසින් පිළිකා රෝගීහු සුවපත් කරන ලදහ / කරනු ලැබූහ /සුවපත් කෙරුණු/කෙරුණාහ.
(v) චණ්ඩ මාරුතය විසින් නිවාස හා දේපළ සුන් බුන් කරනු ලබයි./කෙරෙයි.

(ඇ) (i) පුද්ගලයෝ, පතුරුවති. (ii) ගුරුවරයෙකු, නාට්‍ය රචකයෙක්.
(iii) දෙවියෝ, නිර්මාණකරුවෝ. (iv) ඇඳුරුතුමෝ, රසභාවයන්
(v) ඇය/ලදී. (5x3=15)

05. (i) 1. සිල්වත් - තද්ධිත (අස්ත්‍යර්ථ, ඇත යන අර්ථය)
2. නිති - නිපාත (කාලාර්ථයේ නිපාත)
3. කිරීම - කෘදන්ත (භාවකාරක)
(ii) 1. සුරගනන් - සමාස (විභක්ති සමාස, සම්බන්ධ විභක්ති සමාස)
2. යටැසින් - සන්ධි (පූර්වස්වර ලෝප)
3. බලා - ක්‍රියා (පූර්ව ක්‍රියා)
(iii) 1. වේගයෙන් - විශේෂණ (ක්‍රියා විශේෂණ)
2. මාර්ගයෙන් - විභක්ති (අවධි විභක්ති)
3. රිය අනතුරු - සමාස (කරණ විභක්ති සමාස)
(iv) 1. තම්පලා - සන්ධි (ගාත්‍රාක්ෂර ලෝප සන්ධි)
2. ම - නිපාත (අවධාරණාර්ථයේ නිපාත)
3. ආයුර්වේදයේ - විභක්ති - ආධාර විභක්ති.
(v) 1. ඇගේ - විභක්ති (සම්බන්ධ විභක්ති)
2. දිගටි - තද්ධිත (එයට හුරු යන අර්ථය)
3. මෙන් - නිපාත (උපමාවාචී නිපාත/තුල්‍යාර්ථයේ නිපාත) (ලකුණු 5x3 = 15)

06. (අ) 1. ස්වදේශීය 2. තාත්වික 3. ප්‍රවේණි 4. විදේශීය
5. ආවේණික 6. ලෞකික (ලකුණු 1/2 x 6 = 3)

(ආ) 1. පූජෝත්සව 2. උනුන් 3. පිත්‍රර්ථ 4. දෙවුර
5. අන්වීක්ෂ 6. අම්මල් (ලකුණු 1/2 x 6 = 3)

(ඇ) 1. ආදි සිසුන් - කර්තෘ විභක්ති, ශිෂ්‍යයෝ - ප්‍රථමා විභක්ති
2. දෙවියනි - ආලපන විභක්ති, මට - සම්ප්‍රදාන විභක්ති
3. දුම්රියෙන් - අවධි විභක්ති, යතුරුපැදියෙන් -කරණ විභක්ති (ලකුණු 1/2 x 6 = 3)

(ඈ) (i) 'සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය.'' සියල්ලෝ තේරුම් ගනිත්වා !
(ii) සිංහල හෝඩියේ හ්‍රස්ව (කෙටි) ස්වර කොපමණ ද?
(iii) ඕ යහපත ; පැහැපත ; රූපත. (ලකුණු 1/2 x 6 = 3)

(ඉ) (i) තමාට පැන් ටිකක් දෙන ලෙස යාචකයා කීය.
(ii) තමා ද එදින පැමිණෙන බව ශක්‍රයා පැවසීය.
(iii) තමන් විභාගය උසස් ලෙස සමත්වන බව ශිෂ්‍යයෝ පැවසූහ. (ලකුණු 1x3 = 3)

07. (i) අවබෝධය, ආගමික, ගෞරවය, විශ්වාසය, සංහිඳියාව, සහජීවනය.

(ii) **අන්‍යෝන්‍ය** - කොම්බුව, යංශය, ඇලපිල්ල, හල්පිල්ල, යංශය
**නිවැරදි** - කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය, කෙටි ඉස්පිල්ල.
**ගෞරවය** - කොම්බුව, ගයනුකිත්ත

(iii) 1. විශ්වාසය, ආත්මාර්ථය
2. සංහිඳියාව
3. උදෙසා, ඇදහිලි, අන්‍යාගමි, ආත්මාර්ථකාමී, උත්තරීතර, උතුම්

(iv) වි + අවුල් - ආගම සන්ධිය
එකින් + එක - ස්වර සන්ධිය
ආත්ම + අර්ථය - දීර්ඝ සන්ධිය

(v) 1. අපර ක්‍රියා - වීමට 2 මිශ්‍ර ක්‍රියා - දිනා ගනිමින්
3. පූර්ව ක්‍රියා - රැගෙන (3 x 5 = 15)

08. (i) අන්තඃස්ථ අක්ෂර (අර්ධ ස්වර) ස්වර ස්වභාවය හා ව්‍යඤ්ජන ස්වභාවය අතර හඬ නැගෙන අක්ෂර අන්තඃස්ථ අක්ෂර වේ. උදා ය ර ල ව
ඉ → ය් ඍ → ර් ඏ → ල් උ → ව්

(ii) ගාත්‍රාදේශ සන්ධිය
විසන්ධියෙහි පිහිටි ගතකුරක් වෙනුවට වෙනත් ගතකුරක් ආදේශ කිරීමෙන් සිදුකරන සන්ධිය ගාත්‍රාදේශ
සන්ධිය වේ.
දඬු + කම් = දඬුවම්
සිතු + කම් = සිතුවම්
ගිනි + කම් = ගිනියම්
බුදු + සරණ = බුත්සරණ
සත් + උපදේශ = සදුපදේශ
පස් + සිල් = පන්සිල්

(iii) උපසර්ග භාවිතය
නාමයකට හෝ ක්‍රියාවකට මුල යෙදී එහි අරුතට බලපෑ හැකි පද උපසර්ග පද වේ.
ප - පබල අනු - අනුනායක පර - පරෝපකාර නි - නිවැරදි
අව - අවමානය දු - දුබල ස - සලකුණු වි - වියවුල්

(iv) පුරුෂාර්ථ සර්වනාම
අමතන, ඇමතුම ලබන හා අන්‍ය පුද්ගලයන් අර්ථ දැක්වීම සඳහා යොදන සර්ව නාම වේ.
අමතන පුද්ගලයා - මම, අපි
ඇමතුම ලබන්නා - තෝ, තොපි, නුඹ, නුඹලා
අන්‍ය පුද්ගලයා - හේ, ඕ, ඔහු, ඇය, ඈ, ඔවුන්

(vi) ත්‍රෛකාලික ක්‍රියා
කාලතුන සඳහා ම වර නැගෙන ක්‍රියාව ත්‍රෛකාලික ක්‍රියාව ලෙස හැඳින්වේ. මෙය පුරුෂ හා වචන වශයෙන් ද වර නැගේ.

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| | ප්‍ර. පු. | නැටීය | නැටූහ |
| අතීත කාල | ම.පු. | නැටීහි | නැටූහු |
| | උ.පු | නැටීම් | නැටූමු |
| | ප්‍ර.පු. | නටයි | නටති |
| අනතීතකාල | ම.පු. | නටහි | නටහු |
| (වර්තමාන/අනාගත) | උ.පු. | නටමි | නටමු. |

(5 X 3 = 15)